අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. } ED/1/1/5/3

ඔබේ යොමුව / உமது இல. / Your Ref. }

දිනය / திகதி / Date } 2023.03. 22

**චක්‍රලේඛ අංකය - 10/2024**

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සහ
සියලුම විදුහල්පතිවරුන් වෙත.

**2024 පාසල් අධ්‍යයන වර්ෂයේ දී පාසල් දරුවන් නාට්‍ය සහ චිත්‍රපට දර්ශන නැරඹීම සඳහා සහභාගී කරවීම.**

කොවිඩ් 19 වසංගතයෙන් අනතුරුව පැන නැගුණ සමාජයීය අපහසුතා මගින් පාසල් පද්ධතියේ දෛනික කටයුතුවලට සිදු වූ හානිකර බලපෑම් සමනය කර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය යථා තත්වයට පත් කිරීමේ අවශ්‍යතාව ප්‍රමුඛ බැවින්, 2025 ජනවාරි 17 දින දක්වා ක්‍රියාත්මක වන පාසල් අධ්‍යයන වර්ෂයේ දී පාසල මගින් දරුවන් නාට්‍ය හෝ චිත්‍රපට දර්ශන නැරඹීමට සහභාගී කරවීම පහත ආකාරයට අනුව සිදු කළ යුතු බව දන්වමි.

01. අ.පො.ස. සාමාන්‍ය පෙළ සහ අ.පො.ස. උසස් පෙළ විෂය නිර්දේශ සඳහා ජාතික අධ්‍යාපන ආයතනය මඟින් නම් කරන ලද දේශීය නාට්‍යකරුවන්ගේ නිර්දිෂ්ට නාට්‍ය හැර අන් සියලු නාට්‍ය නැරඹීම සඳහා පාසල් පැවැත්වෙන දිනයන්හි පෙ.ව.7.30ත් ප.ව.1.30ත් අතර කාල වේලාවේ දී සිසු සිසුවියන් සහභාගී නොකළ යුතු ය. නාට්‍ය නැරඹීමට සහභාගී කරවිය යුත්තේ ද විෂය නිර්දේශ අනුව එම නාට්‍ය නැරඹීම සඳහා නිර්දේශිත ශ්‍රේණිවල අදාළ සිසු සිසුවියන් පමණි. (යම් විෂය නිර්දේශයක අන්තර්ගතයක් ආශ්‍රිතව නාට්‍යයක් නිෂ්පාදනය කිරීම දරුවන්ට එම නාට්‍ය ප්‍රදර්ශනය කිරීම සඳහා සුදුසුකමක් හෝ අනිවාර්ය කොන්දේසියක් හෝ නො වේ).

02. ඉහත අංක 01 කරුණට අයත් නොවන නාට්‍ය මෙන්ම පාසල් දරුවන්ට ප්‍රදර්ශනයට අවසර ඉල්ලා සිටින චිත්‍රපට ද ඔවුන්ට නැරඹීමට සුදුසු හෝ නුසුදුසු බවට නිර්දේශ ලබා දෙන්නේ, ඒ සඳහා පත් කර ඇති අමාත්‍යාංශ ඇගැයීම් කමිටුවේ නිර්දේශ අනුව ය. මෙම නාට්‍ය සහ චිත්‍රපට දර්ශන සඳහා පාසල් මඟින් සිසු සිසුවියන් සහභාගී කරවීම සිදු කළ යුතු වන්නේ, පාසල් පැවැත්වෙන දිනයන්හි ප.ව. 1.30න් පසුව හෝ සති අන්ත දිනවල ය.

03. පාසල් දරුවන්ට නාට්‍ය හා චිත්‍රපට ප්‍රදර්ශනය කිරීම හා සම්බන්ධ අනෙකුත් සියලු කරුණු සඳහා 01/2019 අංක දරන චක්‍රලේඛයේ කොන්දේසි අනුගමනය කළ යුතු වේ.

04. නාට්‍ය සහ චිත්‍රපට දර්ශන සඳහා අමාත්‍යාංශයෙන් නිකුත් කෙරුණු අවසර ලිපි සම්බන්ධ වංචනික කටයුතු ද අනාවරණය වී ඇති බැවින්, මේවායෙහි සංවිධායකවරුන් ඉදිරිපත් කරන ලිපිවල පිටපත් තමන් වෙත තබා ගත යුතු බවටත්, අවශ්‍ය විටෙක එම ලේඛනවල සත්‍ය හෝ අසත්‍ය බව දරුවන් සහභාගී කරවීමට පෙර අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාවෙන් හෝ සෞන්දර්ය අධ්‍යාපන ශාඛාවෙන් තහවුරු කරගත යුතු බවටත් උපදෙස් දෙමි.

වසන්තා පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister } +94112784832 / +94112784825 / minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary } +94112784811 / +94112785162 / secretary.education@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 ☎ +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

17

මගේ යොමුව / எனது இல. / My Ref. ED/1/1/5/3 ඔබේ යොමුව / உமது இல. / Your Ref. දිනය / திகதி / Date 2019.01.09

චක්‍රලේඛ අංකය: 01/2019

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කොට්ඨාස භාර නි.අ.අ./ස.අ.අ.වරුන්,
සියලුම විදුහල්පතිවරුන්,

## පාසල් දරුවන් සඳහා නාට්‍ය දර්ශන සහ ඒ ආශ්‍රිත වෙනත් වැඩසටහන් පැවැත්වීම

නාට්‍ය හා රංග කලාව සහ භාෂාව හා සාහිත්‍යය යන විෂයයන් යටතේ සිසුන් විශාල පිරිසක් නාට්‍ය කලාව හදාරන බැවින් පාසල් සිසුන් අතරෙහි නාට්‍ය කලාවේ ව්‍යාප්තිය තව දුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා කලාත්මක සහ ගුණාත්මක ප්‍රමිතියෙන් ඉහළ නාට්‍ය නැරඹීමට අවස්ථා ඇති කිරීම සුදුසු වේ. ඒ අනුව නාට්‍ය හා රංග කලාව සහ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්ට අදාළ නාට්‍ය නිර්මාණ සහ ආශ්‍රිත වැඩසටහන් පැවැත්වීම සම්බන්ධයෙන් පහත සඳහන් කොන්දේසි ක්‍රියාත්මක කෙරේ.

"බාහිර පාර්ශ්වයන්ට පාසල් දරුවන් සඳහා නාට්‍ය සහ චිත්‍රපට දර්ශන හෝ වැඩසටහන් පැවැත්වීම ප්‍රමිතිගත කිරීම" යන මැයෙන් යුතු අධ්‍යාපන ලේකම්ගේ 2012.05.17 දින නිකුත් කළඅංක 2012/16 දරන චක්‍රලේඛය සහ 2016.04.07 දින නිකුත් කරන ලද අංක 2016/10 දරන චක්‍රලේඛය මෙයින් අවලංගු කෙරේ. නාට්‍ය දර්ශන පාසල් මට්ටමින් පෙන්වීමට අදාළව පෙර යම් අවසරයක් ලබා දී ඇත්නම් ඒ සියලු අවසරයන් ද ඒ සමග ම අවලංගු වේ.

1. **පාසල් සිසුන් සඳහා නැරඹීමට සුදුසු නාට්‍ය**

1.1. රාජ්‍ය ආයතන විසින් පවත්වන ලද සහ දැනට පවත්වනු ලබන පහත සඳහන් නාට්‍ය උළෙළ වල හෝ තරඟ වල අවසාන වටය හෙවත් ජාතික මට්ටමට ඉදිරිපත් වූ නාට්‍ය.

අ) අවසර ඉල්ලා සිටින දිනයේ සිට පූර්වාසන්න වර්ෂ තුනක් ඇතුළත නිෂ්පාදනය වී ඇති, අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පවත්වන ලද සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා තරඟය / උළෙළ සඳහා ඉදිරිපත් කිරීමෙන් පසු හොඳම නිෂ්පාදනය ලෙස තෝරා ගැණුන නාට්‍ය,

ආ) අවසර ඉල්ලා සිටින දිනයේ සිට පූර්වාසන්න වර්ෂ තුනක් ඇතුළත නිෂ්පාදනය වී ඇති, අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පවත්වන ලද රාජ්‍ය පාසල් නාට්‍ය උළෙල සඳහා ඉදිරිපත් කිරීමෙන් හොඳ ම නිෂ්පාදනය ලෙස තෝරා ගැනුණු නාට්‍ය,

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister ☎ +94112784832 +94112784825 minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary ☎ +94112784811 +94112785162 secretary.education@moe.gov.lk

ඈ) අවසර ඉල්ලා සිටින දිනයේ සිට පූර්වාසන්න වර්ෂ තුනක් ඇතුළත නිෂ්පාදනය වී ඇති, අධ්‍යාපන අමාත්‍යාංශය සහ ටවර් හෝල් රඟහල පදනම එක්ව සංවිධානය කරන ලද සමස්ත ලංකා පාසල් ටවර් හෝල් නාට්‍ය තරගය සඳහා ඉදිරිපත්ව හොඳ ම නිෂ්පාදනය / ප්‍රථම ස්ථානය ලබා ගත් නාට්‍ය,

ඇ) අවසර ඉල්ලා සිටින දිනයේ සිට පූර්වාසන්න වර්ෂ තුනක් ඇතුළත නිෂ්පාදනය වී ඇති, ශ්‍රී ලංකා කලා මණ්ඩලයෙහි රාජ්‍ය නාට්‍ය අනුමණ්ඩලයෙහි දායකත්වයෙන් පැවැත්වූ " රාජ්‍ය ළමා නාට්‍ය උළෙලේ " හොඳ ම නිෂ්පාදනය ප්‍රථම, දෙවන සහ තෙවන ස්ථාන ලබා ගත් නාට්‍ය, (පැරණි නාට්‍යයක් නම්, එහි නාට්‍ය දර්ශනයක් රාජ්‍ය නාට්‍ය අනුමණ්ඩලය වෙත ඉදිරිපත් කොට, අවසර ඉල්ලා සිටින අවස්ථාවෙහි එම නිෂ්පාදනයෙහි පවතින කලාත්මක සහ ගුණාත්මක තත්ත්වය පිළිබඳ ප්‍රමිති සහතිකයක් ලබා ගත යුතු ය),

ඉ) දරුවන්ට නැරඹීම සඳහා සුදුසු කලාත්මක ප්‍රමිතියෙන් ඉහළ, වෙනත් ස්වතන්ත්‍ර / පරිවර්තන නාට්‍ය නිර්මාණ,

ඊ) දැනට ක්‍රියාත්මක නාට්‍ය හා රංග කලා විෂයමාලාවන්හි රස වින්දනාත්මක හා ප්‍රායෝගික කොටස්වලට සෘජුව ම අදාළ වන ලෙස හෝ විෂය දැනුම පෝෂණය කරන ආකාරයෙන් පාසල් අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ විෂය ප්‍රවීණයන් හෝ ජාතික මට්ටමේ විෂය විශේෂඥයන් සැකසූ වැඩමුළු සහ ඒ ආශ්‍රිතව රඟ දක්වන නාට්‍ය,

උ) රජයේ හෝ රජය පිළිගත් ආයතන මගින් පමණක් හෝ එම ආයතනවල අනුග්‍රාහකත්වය යටතේ හෝ යම් ප්‍රවර්ධනාත්මක අරමුණු පදනම් කර ගත් (උදා: මත් ද්‍රව්‍ය නිවාරණ, සෞඛ්‍ය, පරිසර යනාදි) නොමිලේ ප්‍රදර්ශනය කරන නාට්‍ය.

1.2 පාසල්වල නාට්‍ය හා රංග කලාව, භාෂාව හා සාහිත්‍යය යන විෂයමාලාවන් සඳහා ජාතික අධ්‍යාපන ආයතනය විසින් නිර්දේශිත දේශීය / විදේශීය නාට්‍ය නිෂ්පාදන.

**2. පොදු කොන්දේසි**

2.1 1.1(අ) සිට 1.1(ඈ) දක්වා වගන්තිවලට අයත් නාට්‍ය සඳහා ඉදිරිපත් විය හැකි වනුයේ, එම නිර්මාණයන්ට දායක වූ පාසල්වලට පමණි. එමෙන් ම ඉහත 1.1 (ඇ),(ඉ) සහ 1.2 වගන්තිවලට අයත් නාට්‍යවල මුල් කෘතිය / නිර්මාණ තමන්ට අයත් නො වේ නම්, තමන්ට ඒවා ඉදිරිපත් කිරීමට ඇති හැකියාවේ නීත්‍යානුකූල භාවය සනාථ කළ යුතු ය.

2.2 ඉහත (ඊ) සහ (උ) යටතට අයත් වන වැඩසටහන්වලට හා නාට්‍ය සඳහා අනුමැතිය ලබා දෙන්නේ, ඒ ආශ්‍රිත වැඩමුළුවල පවත්නා අධ්‍යාපනික අදාළත්වය පිළිබඳව ජාතික අධ්‍යාපන ආයතනයේ සෞන්දර්ය දෙපාර්තමේන්තුව සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව එක්ව සිදු කරන සමාලෝචනයකිනි.

2.3 මෙම සියලු නිර්මාණ පාසල් පද්ධතියේ පිළිගත් වටිනාකම් හා හර පද්ධතීන් වලට අනුකූල විය යුතුය. සංස්කෘතික හා සමාජීය වශයෙන් නොගැළපෙන භාෂා ව්‍යවහාරයන් ගෙන් තොර වීමත් මත්ද්‍රව්‍ය හා දුම්වැටි භාවිතය, ඝාතන හෝ වධ හිංසා පැමිණවීම් වලට අදාළ ප්‍රචණ්ඩකාරී දර්ශන, ගෘහස්ථ හිංසන සහ ලිංගිකත්වය ඉස්මතු නොවීමත් අනිවාර්ය වේ. එමෙන් ම ඉදිරිපත් කරනු ලබන වැඩසටහන් වල තේමා /කතා වස්තු /ගී පද මාලා/දෙබස් ආදිය ජාති, ආගම්, කුල භේදවලට සහ සමාජ විරෝධී අරමුණුවලට තුඩු නොදෙන එවැනි අදහස් ගම්‍ය නොවන ඒවා විය යුතු අතර ආගම්, සංස්කෘතික හා දේශපාලනික මති මතාන්තර හෝ ප්‍රතිපත්තීන් හේතු කොට ගෙන කිසියම් පුද්ගලයෙක්, ආයතනයක් හෝ සමාජ කොට්ඨාසයක් අපහසුවට පත් විය හැකි ආකාරයේ ඉදිරිපත් කිරීම් ඇතුළත් නොවිය යුතු ය.

### 3. අනුමැතිය ලබා දීමේ ක්‍රමවේදය

3.1 පාසල් වල පෙන්වීමට ඉල්ලුම් කරනු ලබන නාට්‍ය හෝ වැඩසටහන් සඳහා විධිමත් අයදුම්පතක් අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන ශාඛාවට ඉදිරිපත් කළ යුතුය. (ඒ හා සම්බන්ධ ආදර්ශ අයදුම්පත www.moe.gov.lkදරන අධ්‍යාපන අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් ලබා ගැනීමට හෝ අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය ශාඛාවෙන් ලබා ගැනීමට හෝ හැකියාව ඇත.)

3.2 පාසල්වල පෙන්වීමට ඉල්ලුම් කරනු ලබන නාට්‍යයේ හෝ වැඩසටහනේ පිටපත, ජාතික අධ්‍යාපන ආයතනයෙන් (සෞන්දර්ය දෙපාර්තමේන්තුවෙන්) නිරීක්ෂණය කර නිර්දේශ කළ යුතුය. නිර්දේශිත පිටපත් හා සම්බන්ධ නාට්‍යයේ නිෂ්පාදනය අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් හා ජාතික අධ්‍යාපන ආයතනයේ කථිකාචාර්යවරුන් ගෙන් සැදුම් ලත් අවම වශයෙන් 3 දෙනෙකුගෙන් සමන්විත අනුමත කමිටුවක් මගින් නිරීක්ෂණය කර සහතිකයක් ලබා දෙනු ලැබේ. එම සහතිකය මත පදනම්ව නාට්‍ය ප්‍රදර්ශණය සඳහා අනුමැතිය ලබා දීම පහත ආකාරයෙන් සිදුවේ.

01. පළාත් පාසල් තුළ නාට්‍ය ප්‍රදර්ශණය සඳහා අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් අනුමැතිය ලබා ගත යුතුවේ.

02. ජාතික පාසල් තුළ නාට්‍ය ප්‍රදර්ශනය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාවෙන් අනුමැතිය ලබා ගත යුතු වේ.

### 4. නාට්‍ය ප්‍රදර්ශණය සඳහා අනුමැතිය ලබා දීමේදී පහත කොන්දේසි වලට යටත් වේ.

4.1 නාට්‍ය අනුමැතිය ලබා ගැනීමේදී නාට්‍ය නිෂ්පාදකවරුන්ට අදාළ කොන්දේසි.

- අනුමත නාට්‍ය නිර්මාණ කලාප මට්ටමින් ප්‍රදර්ශනය කිරීමේ දී, අධ්‍යාපන අමාත්‍යාංශය ද ඇතුළු අදාළ සියලු ආයතනවල අදාළ ලේඛන, කලාප අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කර අවසර ලබා ගත යුතු වේ.

- වැඩසටහනේ පිරිවැය සඳහා නාට්‍ය සංවිධායකයන් මුදලක් අය කරන්නේ නම්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය යටතේ ඉතා සාධාරණ සහන මුදලක් ප්‍රවේශ පත්‍රයක් සඳහා අය කළ යුතු ය. එක් නාට්‍ය දර්ශනයක් සඳහා අලෙවි කරනු ලබන ටිකට්පත් සංඛ්‍යාව, එය වේදිකාගත කරන ශාලාවේ ආසන සංඛ්‍යාව නොඉක්මවිය යුතු අතර, එය එම රංග ශාලාව අයත් වන අධ්‍යාපන කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ පූර්ව අනුමැතියට ඉදිරිපත් කොට අවසර ලබා ගත යුතු ය. ප්‍රවේශ පත්‍ර මිල දී ගැනීම සඳහා සිසු දරු දැරියන්ට හා දෙමාපියන්ට බල කිරීම සපුරා තහනම් ය.

- මෙම චක්‍රලේඛයට අනුව ප්‍රදර්ශනය සඳහා අනුමත වූ නාට්‍යවලට හැර අන් කිසිදු නාට්‍යයකට "පාසල් දර්ශන" යනුවෙන් තම පූර්ව ප්‍රචාරක කටයුතු සිදු කිරීම සපුරා තහනම් වේ. චක්‍රලේඛයට අනුව ප්‍රදර්ශනය සඳහා අනුමත වූ නාට්‍යවලට යම් අධ්‍යාපන කලාපයක් ආශ්‍රිතව "පාසල් දර්ශන" යනුවෙන් පූර්ව ප්‍රචාරක කටයුත්තක් සිදු කළ යුත්තේ ද අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ පූර්ව අවසරය යටතේ පමණි.

**4.11 නාට්‍ය පෙන්වීම හා සම්බන්ධයෙන් විදුහල්පතිවරුන්ට අදාළ කොන්දේසි**

- ඉහත 3.1 සහ 3.2 කොන්දේසිවලින් ආවරණය වන අවස්ථා සම්බන්ධයෙන් අදාළ කලාපයේ කලාප අධ්‍යක්ෂගේ විධිමත් අවසර ලිපියක් නොමැතිව හුදෙක් නාට්‍ය දර්ශන සංවිධායකවරුන්ගේ ලිපි ලේඛන හෝ ආරාධනාවන් අනුව කටයුතු කිරීම සපුරා තහනම් වේ.

- පාසලක් තුළ නාට්‍ය දර්ශනයක් පැවැත්වීමට අවසර ලත් නාට්‍යයකට පාසල් කාල වේලාව තුළ දී පැවැත්විය හැකි වන්නේ එක් නාට්‍ය දර්ශනයක් පමණි. ඒ සඳහා අදාළ ශාලාවට සිසු දරු දැරියන් ඇතුළත් කිරීමේ දී, කිසිදු අපහසුවකින් තොරව ශාලාව තුළ රැඳිය හැකි ප්‍රමාණය පමණක් ඊට ඇතුළු කළ යුතු ය.

- දරුවන්ගේ ආරක්ෂාව පිළිබඳ වගකීම ඒ සඳහා යෙදෙන ගුරුභවතුන් වෙත පැවරෙන අතර, අධ්‍යාපනික අවශ්‍යතාවන් මත පදනම් වන මෙම කටයුතුවල සමස්ත වගකීම, නියාමනය හා අධීක්ෂණය අදාළ විදුහලේ විදුහල්පති සහ එම විදුහල අයත් කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත පැවරේ.

- මෙම වැඩසටහන් මඟින්, පාසලක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට මෙන් ම එහි විනයට ද කිසිදු ආකාරයක බාධාවක් ඇති නොවිය යුතු අතර ඒ ආශ්‍රිතව පාසලට අදාළ චක්‍රලේඛ, නීති රීති, ව්‍යවස්ථා හා මූල්‍ය රෙගුලාසි කිසිවක් ද උල්ලංඝනය නොවිය යුතු ය.

**4.111 අවසර ලබාදීම සඳහා කලාප / පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට අදාළ කොන්දේසි**

- පාසල පිහිටි ප්‍රදේශය ආසන්න රංග ශාලාවක පාසල් කාල වේලාව තුළ පැවැත්වෙන නාට්‍ය දර්ශනයක් නම්, එම නාට්‍යය නැරඹීම විෂයානුබද්ධ වශයෙන් අත්‍යවශ්‍ය වන සිසු දරුවන් පමණක් දෙමාපියන්ගේ එකඟතාව මත සහ එම විදුහල අයත් කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ පූර්ව අවසරය මත රැගෙන යා හැකි ය. විදුහලකට මෙම අවස්ථාව ලබා දිය හැක්කේ පාසලේ කටයුතුවලට සහ සිසුන්ගේ අධ්‍යාපන කටයුතුවලට බාධාවක් නො වන පරිදි ය.

- ඉහත 1.1 සහ 1.2 යටතේ ආවරණය වන යම් වැඩසටහනක් පාසල් කාල වේලාවේ දී යම් පාසලක් තුළ පවත්වෙන්නේ නම්, එම විදුහල අයත් කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ පූර්ව අවසරය මත එය සිදු කළ යුතු ය. විදුහලකට මෙම අවස්ථාව ලබා දිය හැක්කේ වර්ෂයක පළමු හා දෙවන පාසල්වාර ඇතුළත පමණි.

- තම කලාපයේ පැවැත්වීමට අවසර ලබා දෙනු ලබන වැඩසටහන් පිළිබඳව, අදාළ කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ අනිවාර්යයෙන්ම තම පළාතේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හා පළාත් අධ්‍යාපන ලේකම් දැනුවත් කළ යුතු ය.

- අවසර ලබා දුන් නාට්‍යය හෝ වැඩසටහන් සම්බන්ධයෙන් වුව ද පැමිණිලි හා චෝදනා ඉදිරිපත් වේ නම් විධිමත් පරිදි, කරුණු පිරික්සා බලා ඕනෑම මොහොතක එම අවසරය අවලංගු කළහැකිය. ඒ සඳහා කිසිදු අවස්ථාවක යළි අවසර ලබා නොදිය යුතු ය. ඒ බවඅධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත ද දැනුම් දිය යුතු ය.

මෙම චක්‍රලේඛයේ කොන්දේසිවලට අනුකූලව අවසර ලබා ඇති නාට්‍ය පිළිබඳ තොරතුරු www.moe.gov.lk දරන අධ්‍යාපන අමාත්‍යාංශයීය වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කෙරෙනු ඇත. චක්‍රලේඛයේ කොන්දේසි උල්ලංඝනය වන පරිදි අධ්‍යාපන ක්ෂේත්‍රයේ යම් කිසිවෙක් කටයුතු කරන්නේ නම් ඔහුට හෝ ඇයට හෝ එරෙහිව විනයානුකූලව පියවර ගනු ලැබේ. පාසල් දරුවන් වෙත විශිෂ්ටතම දැනුම් කුසලතා, ආකල්ප සම්ප්‍රේෂණය වන අයුරින් ක්‍රියා කිරීම අප වගකීම වන අතර සෑම විටම උසස්තම නිර්මාණ පිළිබඳ අත්දැකීම් දරුවන් වෙත අත්පත් කර දීමට අප විසින් ගනු ලබන මෙම ප්‍රයත්නය පිළිබඳව අදාළ සෑම පාර්ශවකරුවන් විසින් දක්වනු ලබන සහාය හා දායකත්වය අගය කරමි. එමෙන්ම මෙම චක්‍රලේඛයෙන් ආවරණය නො වන යම් කරුණක් වේ නම් ඒ පිළිබඳ අවසාන තීරණය රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සතුය.

පද්මසිරි ජයමාන්න
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය